# ඇබෑර්තු

## දේශගුණික අවබලපෑම් - බහුපියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA) සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## වාරිමාර්ග අමාත්‍යාංශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ ලෝක බැංකුවේ අරමුදල් සපයනු ලබන දේශගුණික අවබලපෑම් බහුපියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA) සඳහා වන රජයේ බඳවාගැනීම් ක්‍රියාපටිපාටින් ප්‍රකාරව, **"කොන්ත්‍රාත් පදනමින්"**, ව්‍යාපෘති කළමනාකරණ කාර්යමණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත්, උද්යෝගීමත් හා කැපවීමෙන් වැඩ කළ හැකි ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. වගුවේ 03 තීරුවෙහි සඳහන් තනතුරු සඳහා වන වැටුප් අංක 01/2019 දරන MSD චක්‍රලේඛය ප්‍රකාරව වේ.

අයදුම්කරුවන්, වයස අවුරුදු 62 කට අඩු අය විය යුතුය. ඉංග්‍රීසි භාෂා, ප්‍රවීනත්වය හා රජයේ රෙගුලාසි පිළිබඳ දැනුවත්බාවය සමග පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ සිදුකළ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ කාර්ය පළපුරුද්ද සතුවීම, අමතර සුදුසුකම් වේ.

| අංක | PS වර්ගීකරණය | තනතුර | තනතුරු ගණන | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | MSD චක්‍රලේඛ 1/2019 |
| 02 | PS4 | ව්‍යාපෘති ඉංජිනේරු (කොන්ත්‍රාත් කළමනාකරණ) | 01 | |
| 03 | PS6 | ව්‍යාපෘති ලේකම් | 01 | |

අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබාදීම සඳහා www.irrigationmin.gov.lk වෙත ප්‍රවේශ විය යුතු අතර, ඉහත සඳහන් චක්‍රලේඛය පිළිබඳ තොරතුරු සඳහා මුදල් අමාත්‍යාංශයේ මෙම අඩවිය වෙත යොමුවන්න.

අයදුම්පත්, එක් එක් තනතුරක් සඳහා වෙන් වශයෙන් සකස් කොට **2022 නොවැම්බර් 30** දිනට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**වැඩබලන ව්‍යාපෘති අධ්‍යක්ෂ**

දේශගුණික අවබලපෑම් – බහුපියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA), අංක 11, ජාවත්ත පාර, කොළඹ 05.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි. මේ සඳහා බලපෑම්කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර, එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**ලේකම්,**

**වාරිමාර්ග අමාත්‍යාංශය,**

**දිනය : 2022-11-16**